(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **9**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2015 ඔක්තෝබර් මස 20 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පළාත් සභා හා පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ධුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **සිරිපාල ගමලත් මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **මලිත් ජයතිලක මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **අනුර සිඩ්නි ජයරත්න මහතා**

ගරු **(වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**

ගරු **ලකී ජයවර්ධන මහතා**

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු එස්. සිවමෝහන් මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු සිවශක්ති ආනන්දන් මහතා

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩබලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහනදීර මහත්මිය, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන** : කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

"2015 සැප්තැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ දිනට නියමිත කටයුතුවල දැක්වෙන විෂය අංක 1 සිට 6 දක්වා වන 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32, 33, 34, 35 හා 36 දරන නියමයන් සහ අත්තිකාරම් ගිණුම් සීමා වෙනස් කිරීමේ විධානය අනුමත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම් වූ අවස්ථාවේදී ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද රීති ප්‍රශ්නය පිළිබඳව මාගේ තීරණය දැනුම්දීමට කැමැත්තෙමි.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තියේ නියමයන්ට අනුව 2015 මැයි මස 31 වැනි දාට ප්‍රථමව පමණක් විෂය භාර අමාත්‍යවරයාට අදාළ වෙනස් කිරීම් කිරීමට හැකියාවක් ඇති බවත්, එය පාර්ලිමේන්තුව විසින් එදිනට පෙර පමණක් අනුමත කරගත හැකි බවත් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කරමින් පෙන්වා දෙන ලදී.

මෙම කරුණ පිළිබඳව මවිසින් හොඳින් අධ්‍යයනය කරන ලද අතර, අවශ්‍ය නීති උපදෙස් ද ලබාගත්තෙමි.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය පහත සඳහන් පරිදි වේ.

"8 (1) අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතිය ඇතිව මේ පනතේ තෙවන උපලේඛනයේ

(අ) II වන තීරයේ IV වන තීරයේ සහ V වන තීරයේ දැක්වෙන උපරිම සීමා අතරින් කිසිවක්;

(ආ) III වන තීරයේ දැක්වෙන අවම සීමා;

නියමයක් මගින් 2015 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර වෙනස් කිරීම හෝ විචර්තනය කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(2) I වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක් යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස බල නොපැවැත්විය යුතුය.

(3) I වන උපවගන්තිය යටතේ යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයකදී ද ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එකී ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතුය.''

ඒ අනුව 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාට 2015 මැයි මස 31 වන දිනට ප්‍රථම අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඇතිව තෙවන උපලේඛනයේ සඳහන් උපරිම සීමා සහ අවම සීමාවන් වෙනස් කිරීම හෝ විවර්තනය කිරීමට බලයක් ඇත.

ඒ අනුව ගරු මුදල් අමාත්‍යවරයා විසින් -

- විෂය අංක 30602 දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම—දුම්රිය දෙපාර්තමේන්තුව සීමාවන් වෙනස් කිරීම සඳහා 2014 ඔක්තෝබර් මස 9 වැනි දින ද
- විෂය අංක 24702 අත්අඩංගුවට ගන්නා ලද හෝ රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම
- විෂය අංක 21302 පොත් මුද්‍රණය ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම
- විෂය අංක 31002 ගබඩා අත්තිකාරම් ගිණුම
- විෂය අංක 31003 කළ වැඩ අත්තිකාරම් ගිණුම
  - * යන ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම පිළිබඳව 2015 මාර්තු මස 18 වන දිනද
- රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම
  - * සම්බන්ධ සීමාවන් වෙනස් කිරීම සඳහා 2015 අප්‍රේල් මස 01 වන දින ද

අමාත්‍ය මණ්ඩලයේ අනුමති ලබාගෙන ඇත.

එසේ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාගැනීමෙන් පසුව ගරු මුදල් අමාත්‍යවරයා විසින් එකී වෙනස් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමතිය ලබාගැනීමට අදාළ යෝජනා 2015 අප්‍රේල් මස 21 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, හත්වැනි පාර්ලිමේන්තුව විසුරුවා හරින දිනය තෙක් මෙම යෝජනාවන් පාර්ලිමේන්තුව විසින් සම්මත කොට නොතිබුණු බව ම විසින් තහවුරු කරගන්නා ලදී.

ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2015 සැප්තැම්බර් මස 09 වන දින මෙකී සියලු යෝජනාවන් යළිත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාගෙන 2015 සැප්තැම්බර් මස 23 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට යෝජනා සම්මත කර ගැනීමට පියවර ගෙන තිබුණි.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් අදාළ සියලුම අත්තිකාරම් ගිණුම්වල සීමාවන් වෙනස් කිරීමට හෝ විවර්තනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය 2015 මැයි මස 31 වැනි දිනට ප්‍රථමව ලබාගෙන ඇති බව තහවුරු වේ.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියේ (2) උපවගන්තිය ප්‍රකාරව එබඳු නියමයක් බලපැවැත්වීමට නම් පාර්ලිමේන්තුවේ අනුමතිය ලබාගැනීම අත්‍යවශ්‍ය කරුණක් වුවද, එයට කාල සීමා නියමයක් පෙර කී පනතේ නිශ්චිතව දක්වා නොමැත.

එසේ හෙයින්, ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති බවත්, නිශ්චිත වශයෙන් දැක්වෙන අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය නියමිත කාල සීමාව ඇතුළත ලබාගෙන ඇති බවත් ඒ අනුව, 2015 සැප්තැම්බර් මස 23 වැනි දින න්‍යාය පත්‍රයේ ඇතුළත් කර තිබූ දිනට නියමිත කටයුතුවල අංක 1 සිට 6 දක්වා විසර්ජන පනත යටතේ වූ යෝජනා පිළිබඳව එදින ආරම්භ කරන ලද විවාදය,

තවදුරටත් පවත්වාගෙන ගොස් අදාළ යෝජනා හය (6) සභාවේ සම්මත කරගැනීමට හැකි බව දන්වා සිටිනු කැමැත්තෙමි.''

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් ''උදලාගම'' සහ ''පරණගම'' ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තා සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,

(i) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2014 වර්ෂයේ පැවැති 103 වැනි සැසිවාරයේදී පිළිගනු ලැබූ 29 වැනි සම්මුතිය සඳහා මූල ලේඛය; සහ

(ii) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2014 වර්ෂයේ පැවැති 103 වැනි සැසිවාරයේදී පිළිගනු ලැබූ නිර්දේශය

පිළිගන්වන ලදී.

එකියන ලද ලිපි ලේඛන **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා විසින් 2013 වර්ෂය සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එම වාර්තාව ඊට අනුකූලව, පාර්ලිමේන්තුවේ අංක 109 වැනි ස්ථාවර නියෝගය යටතේ අදාළ උපදේශක කාරක සභාවට යොමු කරන ලදී.

(4) මුදල් අමාත්‍යතුමා විසින්,

(i) (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමග කියවනු ලබන 25 වැනි වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය; සහ

(ii) 2014 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව

පිළිගන්වන ලදී.

එකියන ලද ලිපි ලේඛන **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) මුදල් අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එම වාර්තාව ඊට අනුකූලව, පාර්ලිමේන්තුවේ අංක 109 වැනි ස්ථාවර නියෝගය යටතේ අදාළ උපදේශක කාරක සභාවට යොමු කරන ලදී.

(6) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින්,

(i) 2012 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව

අදාළ උපදේශක කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එම වාර්තාව ඊට අනුකූලව, පාර්ලිමේන්තුවේ අංක 109 වැනි ස්ථාවර නියෝගය යටතේ අදාළ උපදේශක කාරක සභාවට යොමු කරන ලදී.

(7) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එම වාර්තාව ඊට අනුකූලව, පාර්ලිමේන්තුවේ අංක 109 වැනි ස්ථාවර නියෝගය යටතේ අදාළ උපදේශක කාරක සභාවට යොමු කරන ලදී.

(8) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(9) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2014 වර්ෂය සඳහා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(10) පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා විසින් 2014 වර්ෂය සඳහා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩසටහන් හා කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(11) සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා විසින් 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 ජුනි 11 දිනැති අංක 1918/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වන ලදී.

එකියන ලද ලිපි ලේඛන **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ කටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 30 හි සඳහන් පරිදි "පැය භාගයකට" යන වචන වෙනුවට "පැයකට" යන වචනය යෙදීමෙන් එම ස්ථාවර නියෝගය මෙම සභාවාරය තුළ දී ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ටී. රංජිත් ද සොයිසා මහතා, ගරු එස්. සී. මුතුකුමාරණ මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව, — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"කෂි බුණ්ඩා ශ්‍රී ලංකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.25 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.55 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

**5. දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ යෝජනාව :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— මෙයට පෙර යෝජනාව මඟින් අවසර දෙන ලද මුදලට වැඩිමනත් වශයෙන් රු.400,000,000,000කට නොවැඩි මුදලක් ශ්‍රී ලංකාවේදී ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ණයට ගැනීමටත්, එම කාර්යය සඳහා (417 වන අධිකාරය වන) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2(1) වැනි වගන්තියට යටත්ව අවශ්‍ය සියළුම අවසර මුදල් අමාත්‍යතුමාට දීමටත්, මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි මුදල් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි මුදල් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

4 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 3 වැනි පිටුවේ 6 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"තුළ වයස අවුරුදු හැටක් වූ හෝ අවුරුදු හැට ඉක්මවූ හෝ වයස අවුරුදු හැට එළඹෙන්නා";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 3 වැනි පිටුවේ 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"හෝ මූල්‍ය ආයතනයක හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ අර්ථානුකූලව යම් ලියාපදිංචි කළ සමිතියක පවත්වා ගෙන";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 4 වැනි පිටුවේ 26 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"නියුක්ත ශ්‍රී ලාංකිකයකු වන යම් පුද්ගලයකුට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය සිට 6 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

7 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 7 වැනි පිටුවේ 1 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"7. 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 7 වැනි පිටුවේ 23 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(අ) 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව,";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 7 වැනි පිටුවේ 29 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(ආ) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 11 වැනි පිටුවේ 1 පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" 'යම් පිරියත, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, උපාංග, මෙවලම්, භාණ්ඩ හෝ උපකරණ' යන වචන ආදේශ කිරීමෙන්;";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 12 වැනි පිටුවේ 21 වන පේළියේ සිට 23 පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" මත බද්දක් සහ 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ විධිවිධාන ඇතුළත මූල්‍යමය සේවා මත වන යම් ජාතිය ගොඩනැගීමේ බද්දක්; හෝ' යන වචන සහ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 13 වැනි පිටුවේ 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"25 වන වගන්තිය යටතේ අඩු කිරීමට ඒ තැනැත්තාට හිමිකම නොමැති-";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තිය සිට 12 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

13 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 17 වැනි පිටුවේ 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"13. ප්‍රධාන ප්‍රඥප්තියේ 40ඇ වගන්තිය, එහි (1) වන උපවගන්තියේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තිය සිට 15 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

16 වන වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 20 වැනි පිටුවේ 4 වන පේළියේ සිට 29 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "ගිවිසුමකට ඇතුළත්ව ඇත්තා වූ ද, මේ පනතේ 16ඇ වගන්තිය හෝ 17අ වගන්තිය යටතේ බදු නිදහස් කාලසීමාවක් භුක්ති විඳිය හැකි වූ ද යම් අලුත් ව්‍යවසායක් විසින්, ආයෝජන සම්පූර්ණ කොට වාණිජ කටයුතු ආරම්භ කළ යුතු බවට 16ඇ වගන්තියෙහි හෝ 17අ වගන්තියේ (2) වන උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති කාලසීමාව කවරක් වුව ද, ඒ ව්‍යවසාය සඳහා 2014 ඔක්තෝබර් මස 31 වන දිනට පෙරාතුව ආයෝජන මණ්ඩල අනුමතය දී ඇත්නම් ද, සහ ව්‍යාපාරයේ ස්වභාවය අනුව යම් ප්‍රායෝගික හේතු මත ඒ ව්‍යවසායේ ආයෝජනය කළ සමාගමට ඒ ව්‍යවසායේ නියමිත ආයෝජන 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සම්පූර්ණ කිරීමට හා 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වාණිජ කටයුතු ආරම්භ කිරීමට නොහැකි නම් ද, ඒ අලුත් ව්‍යවසාය විසින් නිරතව සිටින ක්‍රියාකාරකම්වල ස්වභාවය, 16ඇ වගන්තිය හෝ 17අ වගන්තිය යටතේ සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් පමණක් වන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන්නේ නම් හා ආයෝජකයා විසින් කරන ලද ඉල්ලීමක් මත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ඒ අලුත් ව්‍යවසායේ ප්‍රගතිය පිළිබඳව පරීක්ෂා කොට එකී කාලය දීර්ඝ කිරීම සඳහා වන හේතු යුක්ති සහගත හා පිළිගත හැකි හේතු බවට සනාථ කරන්නේ නම්, ඒ කාලසීමාව 2018 අප්‍රේල් මස 1 වන දින දක්වා දීර්ඝ කරනු ලැබිය යුතු ය.".

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17 වැනි වගන්තිය සිට 19 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

20 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 24 වැනි පිටුවේ 11 වන පේළියේ සිට 36 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "(ii) ඒ අදාළ ලාභ රුපියල් මිලියන විසිපහක් ඉක්මවයි නම්,
>
> - බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ රුපියල් මිලියන විසිපහකට සමාන වන කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දොළහක අනුප්‍රමාණය අනුව විය යුතු ය;
> - බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ ශේෂයෙන් රුපියල් මිලියන දහයක් නොඉක්මවන කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දහහතරක අනුප්‍රමාණය අනුව විය යුතු ය; සහ
> - බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ තවදුරටත් යම් ශේෂයක් වේ නම් එම ශේෂය මත ගෙවිය යුතු බද්ද පහත දැක්වෙන කරුණුවලට යටත්ව, මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ සියයට දොළහකට වැඩි අනුප්‍රමාණ අතුරින් ඊට අදාළ වන අනුප්‍රමාණ අනුව ගණනය කරනු ලැබිය යුතු ය:-";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 26 වැනි පිටුවේ 7 වන පේළියේ සිට 20 පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(ii) ඒ අදාළ ලාභ රුපියල් මිලියන විසිපහක් ඉක්මවයි නම්,

- අදාළ ලාභ, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද, ඒ ප්‍රමාණයට වැඩියෙන් රුපියල් මිලියන විසිපහක් දක්වා වන කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දොළහක අනුප්‍රමාණය මත ගණනය කරනු ලැබිය යුතු ය.
- බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ ශේෂයෙහි රුපියල් මිලියන දහයක් දක්වා වන කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දහහතරක අනුප්‍රමාණය මත ගණනය කරනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

21 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 27 වැනි පිටුවේ 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"59එ. (මත්පැන් හෝ දුම්කොළ නොවන) නිෂ්පාදන නිපදවීමේ ව්‍යාපාරයක් කරගෙන";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 28 වැනි පිටුවේ 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" සිටින යම් දේශීය ව්‍යවසායකයකු විසින්, 2015 අප්‍රේල්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 28 වැනි පිටුවේ 28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" "දේශීය ව්‍යවසායකයා" යන්නෙන් ශ්‍රී ලංකාවේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22 වැනි වගන්තිය සිට 24 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

25 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 31 වැනි පිටුවේ 13 වන පේළියේ සිට 16 පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "රාජ්‍ය භාගයක් හෝ වාර්ෂිකයක් වශයෙන් හෝ," යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"රාජ්‍ය භාගයක් හෝ වාර්ෂිකයක් වශයෙන්; හෝ

(ඇ) 94 වන වගන්තියේ සඳහන් තාක්ෂණික සේවා සඳහා ගාස්තු වශයෙන්,";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

26 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 32 වැනි පිටුවේ 21 වන පේළිය සහ 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(අ) 28(4), 36(2) (ආ), 70(1), 73(1), 76(3), 104(2), 104අ(2), 111, 112, 118, 122, 125 ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

27 වැනි වගන්තිය සභා සම්මත විය.

28 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 34 වැනි පිටුවේ 1 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(ii) සමාගමක් නොවන යම් තැනැත්තකු හෝ යම් හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තාගේ ව්‍යාපාරයේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ ඒ වර්ෂය සඳහා වන පිරිවැටුම රුපියල් මිලියන පන්සියයක් නොඉක්මවන අවස්ථාවක, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අධි සාමාජිකයකු වන ගණකාධිකාරිවරයෙක්,";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

29 වැනි වගන්තිය සිට 30 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

31 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 36 වැනි පිටුවේ 9 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"පැමට අයිතිය ඇති මතිමාත්‍ර බදු බැරකමක යම් ඉතිරි";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

32 වැනි වගන්තිය සභා සම්මත විය.

33 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 37 වැනි පිටුවේ 32 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"33. ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය, එහි (1) වන";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

34 වැනි වගන්තිය සිට 35 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

36 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 40 වැනි පිටුවේ 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(උ) අවශ්‍ය පරිදි කලින් කල කොමසාරිස් ජනරාල්වරයා";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

37 වැනි වගන්තිය සිට 40 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

38 වැනි අලුත් වගන්තිය

මුදල් අමාත්‍යතුමා මතු සඳහන් අලුත් වගන්තිය යෝජනා කළේය.

41 වැනි පිටුවේ 12 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට,—

**"ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය සංශෝධනය කිරීම.**

38. ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ ශීර්ෂයෙහි "රාජ්‍ය භාග හෝ වාර්ෂික" යන වචන වෙනුවට "රාජ්‍ය භාග, වාර්ෂික හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපලේඛනයේ "රාජ්‍ය භාග හෝ වාර්ෂික" යන වචන වෙනුවට "රාජ්‍ය භාග, වාර්ෂික හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු" යන වචන ආදේශ කිරීමෙන්."

"වගන්තිය දෙවැනිවර කියවිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය "යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය හා නාමය**

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය"යි මුදල් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත,ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**7. මුදල් පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි මුදල් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි මුදල් අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 18 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(3) අය බද්ද 2015 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය සභා සම්මත විය.

4 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"යටතේ නිකුත් කරන ලද බලපත්‍රය, 2015 දෙසැම්බර් මස 31 වන දින සිට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය සභා සම්මත විය.

6 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 3 වැනි පිටුවේ 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"6. (1) 2015 ජනවාරි මස 29 වන දිනට, කැසිනෝ ව්‍යාපාරයක"

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 3 වැනි පිටුවේ 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(3) අය බද්ද 2015 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර"

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය සිට 9 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

10 වැනි වගන්තිය

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 6 වැනි පිටුවේ 14 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"එළැඹී සිටින්නා වූ ද, ඒ ගිවිසුමේ දක්වා ඇති බදුවලින් නිදහස් කාලසීමාව ඉකුත් වීමෙන් පසුව, ඒ ගිවිසුමට අනුව නිශ්චය කරන ලද ආදායම් බදු ගෙවීමට යටත් වී සිටින්නා වූ ද සමාගමකට අදාළව, ඒ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයට අනුව ආදායම් බදු ගෙවීමට පෙර ලාභය අදහස් වේ;"

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 6 වැනි පිටුවේ 26 වන සහ 27 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"එය නොතකා, 2015 ඔක්තෝම්බර් මස 31 වන දින, නොවැම්බර් මස 30 වන දින සහ දෙසැම්බර් මස 31 වන දින හෝ ඒ දිනවලට පෙර සමාන වාරික තුනකින් බද්ද ගෙවනු ලැබිය යුතු ය."

